# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1640/8 - 2010 පෙබරවාරි 08 වැනි සඳුදා - 2010.02.08

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

### (262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(1) වගන්තිය යටතේ දෙහිවල - ගල්කිස්ස මහ නගර සභාවේ නියෝජ්‍ය නගරාධිපති ධුරයේ පුරප්පාඩුවක් පිරවීම

පක්ෂ සාමාජිකත්වය අහෝසි වීම හේතු කොට ගෙන දෙහිවල - ගල්කිස්ස මහ නගර සභාවේ නියෝජ්‍ය නගරාධිපති ධුරය පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

ඉහත කී ආඥාපනතේ 65අ(1) වගන්තිය යටතේ, නියෝජ්‍ය නගරාධිපති වන අච්චි මද්දුමගේ දොන් හසල ධනසිරි අමරතුංග නම් වූ නියෝජ්‍ය නගරාධිපති අයත් වන්නා වූ එක්සත් ජාතික පක්ෂය නම් වන පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහක (30) කාල පරිච්ඡේදයක් ඇතුළත නියෝජ්‍ය නගරාධිපති වශයෙන් තෝරා පත් කර ගනු ලැබිය යුතු යයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වූ ද, ඒ පක්ෂයට අයත් වන්නා වූ ද, ඒ දෙහිවල-ගල්කිස්ස මහ නගර සභාවේ සභිකයා පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කර ඇති හෙයින් ද ;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් ඒ පුරප්පාඩුව පිරවීම සඳහා රුවන් කිත්සිරි ලියනගුණවර්ධන මහතා නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද ;

දෙහිවල-ගල්කිස්ස මහ නගර සභාවේ තේරීම් භාර නිලධාරි ඒ. සේනානායක වන මම, (262 වන අධිකාරය වූ ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(1) වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින්, රුවන් කිත්සිරි ලියනගුණවර්ධන මහතා දෙහිවල - ගල්කිස්ස මහ නගර සභාවේ නියෝජ්‍ය නගරාධිපති වශයෙන් තෝරා පත් කර ගත් බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

ඒ. සේනානායක,<br>
තේරීම්භාර නිලධාරී,<br>
දෙහිවල - ගල්කිස්ස මහ නගර සභාව.

2010 පෙබරවාරි මස 05 වැනි දින,<br>
මැතිවරණ කාර්යාලය,<br>
කොළඹ දිස්ත්‍රික්කය.

02-532


1A - G 12413 — 350 (2010/02) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.